14-07-2023

ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද්

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

## සිංහල භාෂාව හා සාහිත්‍යය

පළමු වාර පරීක්ෂණය-2023 | 08 ශ්‍රේණිය | කාලය පැය 2

Learning Resource Center R De Mazenod College Kandana

- **ඉරි ඇඳි පදයට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) නාංගි නිතරම කිඹුල් කඳුළු හෙළන බව අක්කා පැවසුවාය.
   i. පුරුද්දට ඇඬීම
   ii. කෑ ගසා ඇඬීම
   iii. කිඹුලකු සේ ඇඬීම
   iv. බොරුවට ඇඬීම

2) නව සභාපතිවරයා අල්ලේ නැටවීමට ඔවුන් දැරූ උත්සහය අසාර්ථක විය.
   i. මෙල්ල කිරීමට
   ii. අල්ලා ගැනීමට
   iii. අවනත කර ගැනීමට
   iv. අවශ්‍ය පරිදි හැසිරවීමට

**ගැළපෙන ප්‍රස්ථාව පිරුළ හෝ ඉඟිවැකිය තෝරන්න.**

3) යහපත් දෙයක් කිරීමට ගොස්, කරදරයට පත්වීම,
   i. කබලෙන් ලිපට වැටුනා වගෙයි
   ii. වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටුණා වාගෙයි
   iii. ගහෙන් වැටුණ මිනිහාට ගොනා ඇන්නා වගෙයි
   iv. කොහොඹ ගහට කරවිල වැල ගියා වගෙයි

4) වෛද්‍යවරයා උදැසනින්ම රෝහලට පැමිණියේය.
   i. හිසේ මලක් පිපුණි
   ii. අනු නවයෙන් බේරුනි
   iii. කුකුලා අතින් ගෙන
   iv. ලෑල්ලට පාගා

5) අක්ෂර මාලාව පෙළගස්වා ඇති සම්මත පිළිවල හඳුන්වන්නේ,
   i. සුමංගල ශබ්ද කෝෂය ලෙසය
   ii. සකස්කඩ කියාය
   iii. මලලසේකර ශබ්ද කෝෂය ලෙසය
   iv. අකාරාදි පිළිවල කියාය

6) රබීන්ද්‍රනාත් තාගෝර්තුමා විසින් රචිත, පාඨක විචාරය අවධානයට යොමු වූ කාව්‍ය ග්‍රන්ථයක් වන්නේ,
   i. ගීතාංජලී
   ii. සුභාෂිතය
   iii. කාව්‍යශේඛරය
   iv. ජාතික තොටිල්ල

7) " රාත්‍රිය " නම් කවි පංතිය රචනා කළේ,
   i. එස් මහින්ද හිමියන්
   ii. අරිසෙන් අහුබුදු මහතා
   iii. වෑත්තෑවේ හිමියන්
   iv. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා

8) ලීල් ගුණසේකර මහතා රචනා කළ කෘතිය වන්නේ,
   i. හරි පුදුම ඉස්කෝලේ
   ii. පෙත්සම
   iii. සුදෝ සුදූ
   iv. අඹ යහළුවෝ

- **පහත වාක්‍යවල ඉරිඇඳි පද කවර ක්‍රියා වර්ගයට අයත්දැයි තෝරන්න.**

9) අපි කුඹුරේ මෙන්ම ඇලේ දොලේ ද දුව පැන ඇවිදිමින් සෙල්ලම් කළෙමු.
   i. පූර්ව ක්‍රියාවකි
   ii. මිශ්‍ර ක්‍රියාවකි
   iii. ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි
   iv. විධි ක්‍රියාවකි

10) අම්මා පොළට ගොස් ඉක්මනින්ම ගෙදර ආවාය
   i. මිශ්‍ර ක්‍රියාවකි
   ii. විධි ක්‍රියාවකි
   iii. පූර්ව ක්‍රියාවකි
   iv. ආශිර්වාද ක්‍රියාවකි

11) බලු මහ මුහුදු එම සඳ උතුරින් පෙනෙන,
   i. මිශ්‍ර ක්‍රියාවකි
   ii. පූර්ව ක්‍රියාවකි
   iii. විධි ක්‍රියාවකි
   iv. ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි

12) " දරු නැළවිල්ල " නැමති දේශාභිමානී පද්‍ය කෘතිය හඳුන්වන කවත් නමක් වන්නේ,

i. ජාතික තොටිල්ල
ii. සිරිත් මල්දම
iii. රාත්‍රිය
iv. නිදහසේ දැහැන

13) මගේ හුරතල් අක්කාගේ - මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නේ පිනි බිංදුත් - හඳමු එකක් ඒ වාගේ
ඉහත කවියේ පිනි බිංදු සමාන කර ඇත්තේ,

i. රාත්‍රි අහසටය
ii. හුරතල් අක්කාටය
iii. අක්කාගේ මාලේ මුතු ඇට වලටය
iv. තරු වලටය

14) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

i. ආමන්ත්‍රණය
ii. කණගාටුව
iii. ගවේශණය
iv. දේශණය

15)

i. පිළිවෙළ
ii. ප්‍රශ්ණ
iii. නයගැතියා
iv. පුරුශ

16)

i. අද්‍යාපන
ii. ලක්ශණ
iii. වාර්ශික
iv. නිර්මාණය

- නොගැලපෙන යුගල පදය වන්නේ,

17)

i. හට්ටිමුට්ටි
ii. ලට්ටලොට්ට
iii. යානවාහන
iv. ළමාහඬ

- මුලින් දී ඇති පිල්ලම් වර්ගයට ගැළපෙන වචනය තෝරන්න.

18) යංශය,

i. ප්‍රධාන
ii. සාහිත්‍ය
iii. කෘත්‍රිම
iv. ගෞරවය

- මුලින් දී ඇති පදයට විරුද්ධ අර්ථයක් දෙන පදය තෝරන්න.

19) උත්තම,

i. උන්නතිය
ii. උදාර
iii. අධම
iv. උතුම්

20) ආකාරාදි පිළිවෙලට නිවැරදිව යොදී ඇති පද පේළිය වන්නේ,

i. සඳුන්, සරස්වතී, සාලින්ද, සදීශා
ii. මලිකි, මලීෂ, මධුර, මිකිලා
iii. කන්ද, කැන්ද, කුන්ද, කෙන්ද
iv. දම්, කහ, රතු, නිල්

II කොටස

- 1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වන අතර, තෙක් ප්‍රශ්න වලින් 3ක් තෝරා ලියන්න. ( ප්‍රශ්න 5කට පිළිතුරු සපයා තිබිය යුතුයි )

1) ඔබ පංති කාමරයේදී කළ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඔබ කළ ක්‍රියාකාරකම කුමක්ද ? ල.02
ii. ඒ සඳහා කරුණු සොයාගත් මූලාශ්‍ර 4ක් නම් කරන්න. ල.04
iii. එම ක්‍රියාකාරකම සඳහා ඔබ යෙදූ නම කුමක්ද ? ල.02
iv. එම ක්‍රියාකාරකම කිරීමේදී ඔබට මතුවූ ගැටළු 2ක් ලියන්න ල.04
v. ක්‍රියාකාරකමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 2ක් ලියන්න ල.04

2) පහත මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

i. ගස්වැල් අපේ මිතුරෝය

ii. මගේ රටවත් රටක් මට ලොවේ වෙන නැත.

iii. ලොවටම සමගිය ඉතා වැදගත්ය

iv. දෙමාපියන්ගේ අදාරය අත්දකිමු

ල.14

3) ඔබ ප්‍රදේශයේ පොලිතින් භාවිතය අවම කිරීම සඳහා පවත්වන රැස්වීමට සහභාගී වන ලෙස ආරාධනා කරමින් ප්‍රදේශයේ ග්‍රාමසේවක මහතාට ලිපියක් ලියන්න.

ල.10

4)ඔබ පොත්හලක් විවෘත කරන බව සිතා ඒ පිළිබඳව දැන්වීමක් පල කිරීමට අවශ්‍ය නිසා එම දැන්වීම නිර්මාණය කරන්න.

ල.10

5)පෙළ පොත ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. රබින්ද්‍රනාත් තාගෝර් තුමා සාහිත්‍ය සඳහා නොබෙල් ත්‍යාගය දිනාගත් කෘතිය කුමක්ද ?

ii. එතනහාමිට සාස්තරකරුගෙන් අසා දැන ගැනීමට වුයේ කුමක් ගැනද ?

iii. '' රාත්‍රිය '' නම් පද්‍ය නිර්මාණය රචනා කලේ කවුද ?

iv. ''පෙත්සම '' රචනා කළේ කවුද ?

v. ''පද්මා '' නම් ගඟේ ඔරුපැද ගියේ කවුද ?

ල.10

6) පහත පද වල අරුත් පැහැදිලි කරන්න.

i. සමාජ ප්‍රගතිය

ii. පෘථුල

iii. පුරාණෝක්ති

iv. ජන්මෝත්සවය

v. දේශමාමකත්වය

ල.10

7)පහත කියමන් කා විසින් කාහට පවසන ලද්දේද ?

| | ප්‍රකාශය | කවුද ? | කාටද ? |
|---|---|---|---|
| 01 | '' මේ ඇහුණද බත් උයලා ඇති..... බේදා ගෙන කාපල්ලා... '' | | |
| 02 | '' වැඩක් නං නෑ මහත්තයා '' | | |
| 03 | '' මොනවද විදානගේ වැරදි? | | |
| 04 | '' එහෙනම් ඉස්කොලේ ඇරිලා මාත් එක්ක කැකිරාවට යනවයි කියලා ගෙදර අයට කියලා එන්න ඕනෑ '' | | |
| 05 | '' හෙට උදේ දහයයි විසිතුනට තමයි අලුත් අවුරුදු උදාව සිද්ධ වෙන්නේ '' | | |

ල.10